රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 357

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ -7.
1986 දෙසැම්බර් මස 11 දින.

අමාත්‍යාංශවල සියලුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙත.

## ත්‍රස්තවාදය බලපාන ප්‍රදේශවල රජයේ නිලධරයන්ට දිරි ගැන්වීම් ගෙවීම

දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් ස්ථාන මාරු කරන ලදුව, උතුරු හෝ නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්කයක හෝ දිරි ගැන්වීම් ගෙවීම සඳහා සුදුසු වීම පිණිස ත්‍රස්තවාදය බලපාන කොට්ඨාශයක් වශයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් තීරණය කර ඇති දිස්ත්‍රික්කයක හෝ දිස්ත්‍රික්කයකට වඩා කුඩා වූ නිශ්චිත ප්‍රදේශයක හෝ සේවය කරන රජයේ නිලධරයෙකුට, ඔහුගේ දීමනා ඇතුළත් නොවන මාසික වැටුපෙන් අඩක් හෝ රු: 500/= ක් හෝ යන මෙයින් වැඩි ප්‍රමාණයේ දිරි ගැන්වීම් ගෙවීමක් මාසිකව ගෙවිය හැකිය.

02. ඒ ඒ අමාත්‍යාංශයට ඇති සම්පත් ප්‍රමාණය ඇතුළත වෙමින් දීමනාව ගෙවීමට අමාත්‍යාංශයට ඇති ශක්තිය ද සැලකිල්ලට ගනිමින්, ඒ ඒ අමාත්‍යාංශ වලට මුහුණ දීමට ඇති විවිධ අවස්ථා නිසා, තමන් යටතේ ඇති ආයතන සම්බන්ධයෙන් මෙම ගෙවීම් තීරණය කිරීම එක් එක් අමාත්‍යාංශ ලේකම් වරයෙකුට ස්වකීය අභිමතය පරිදි කළ හැකිය. එම ගෙවීම් සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟත්වය ලබාගත යුතුය.

03. උතුරු හෝ නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්කයක හෝ ත්‍රස්තවාදය බලපාන ප්‍රදේශයක් වශයෙන් තීරණය කර ඇති දිස්ත්‍රික්කයක හෝ දිස්ත්‍රික්කයකට වඩා කුඩා වූ නිශ්චිත ප්‍රදේශයක හෝ සේවය කරන පහත සඳහන් කවර ගණයකට වුව ද අයත් රජයේ නිලධරයෙක් මෙම දිරි ගැන්වීම් ගෙවීම් ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

(අ) යම් නියමිත දිස්ත්‍රික්කයක හෝ ප්‍රදේශයක හෝ සේවය සඳහා විශේෂයෙන් බඳවා ගන්නා ලදුව, ත්‍රස්තවාදය බලපාන ප්‍රදේශයක් වශයෙන් තීරණය කර ඇත්තේ වුවත්, එම දිස්ත්‍රික්කය හෝ ප්‍රදේශය තුළම සේවය කරන රජයේ නිලධරයෙක්.

(ආ) දිරි ගැන්වීම් ගෙවීම් සඳහා මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන අවස්ථාව වන විටත්, උතුරු හෝ නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්කයක හෝ ත්‍රස්තවාදය බලපාන ප්‍රදේශයක් වශයෙන් තීරණය කර ඇති දිස්ත්‍රික්කයක හෝ දිස්ත්‍රික්කයකට වඩා කුඩා වූ නිශ්චිත ප්‍රදේශයක හෝ සිය කැමැත්තෙන් රැඳී සිටින රජයේ නිලධරයෙක්.

(ඇ) දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් උතුරු හෝ නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්කයකට හෝ ත්‍රස්තවාදය බලපාන ප්‍රදේශයක් වශයෙන් තීරණය කර ඇති දිස්ත්‍රික්කයකට හෝ දිස්ත්‍රික්කයකට වඩා කුඩා වූ නිශ්චිත ප්‍රදේශයකට හෝ මාරු කරන ලදුව, සිය කැමැත්තෙන් එහි රාජකාරි භාර ගන්නා රජයේ නිලධරයෙක්.

(ඈ) උතුරු හෝ නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්කයකට හෝ ත්‍රස්තවාදය බලපාන ප්‍රදේශයක් වශයෙන් තීරණය කර ඇති දිස්ත්‍රික්කයකට හෝ දිස්ත්‍රික්කයකට වඩා කුඩා වූ නිශ්චිත ප්‍රදේශයකට හෝ ස්ථාන මාරුවක් ඉල්ලුම් කොට එහි සේවය සඳහා යවනු ලබන රජයේ නිලධරයෙක්.

(ඉ) උතුරු හෝ නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්කයකින් හෝ ත්‍රස්තවාදය බලපාන ප්‍රදේශයක් වශයෙන් තීරණය කර ඇති දිස්ත්‍රික්කයකින් හෝ දිස්ත්‍රික්කයකට වඩා කුඩා වූ නිශ්චිත ප්‍රදේශයකින් පිටතට දෙපාර්තමේන්තු ප්‍රධානයා මාරු කළේ වුවද, තමන්ගේ ම කැමැත්ත පරිදි එම දිස්ත්‍රික්කයේ/ප්‍රදේශයේ රැඳී සිටින රජයේ නිලධරයෙක්.

(ඊ) උතුරු හෝ නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්කයක හෝ ත්‍රස්තවාදය බලපාන ප්‍රදේශයක් වශයෙන් තීරණය කර ඇති දිස්ත්‍රික්කයක හෝ දිස්ත්‍රික්කයකට වඩා කුඩා වූ නිශ්චිත ප්‍රදේශයක හෝ ලියාපදිංචි වූ ඡන්ද හිමියකු වන රජයේ නිලධරයෙක්.

මෙම පරිපාටිය 1986 නොවැම්බර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
ලේකම්.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.